සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
First Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

- වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න

1) ''එම්බා බෙත්ලෙහෙමේ එප්‍රාතා, තී ජුදාහි ගෝත්‍රවලින් ඉතා අල්ප වන්නේය ......, මෙම දිවැස් වැකිය ප්‍රකාශ කරන ලද්දේ
1. මීකා දිවැසිවරයාය
2. යෙසායා දිවැසිවරයාය
3. සෙකරියා දිවැසිවරයාය
4. ජෙරමියා දිවැසිවරයාය

2) එඩේරුන්, දේවදූතයන් වෙතින් ලද පණිවුඩයට අනුව ක්‍රිස්තුස් නම් ගැළවුම්කරුගේ සලකුණ වූයේ
1. ගවලෙන ය
2. ගව ඔරුවක බාවා සිටින බිළිඳෙක් ය
3. දාවිත්ගේ නුවර ය
4. දීප්තිමමත් තාරකාව ය

3) ආබ්‍රහම්ගේ කැඳවීම තුළ අප ඉගෙනගන්නා වැදගත්ම පාඩම නම්,
1. නිරතුරුවම දේවාශිර්වාද අපේක්ෂා කිරීමයි
2. අපට ඇති වැඩිපුර සම්පත් දෙවියන් වහන්සේට පිදීමයි
3. සැම විටම දෙවියන් වහන්සේට ඇදහිල්ලෙන් කීකරු වීමයි
4. ජීවිත බලාපොරොත්තු වලින් තොර වීමයි

4) ''දෙවියන් වහන්සේට නොකල හැකි කිසිවක් නැත'' යන ප්‍රකාශය ලැබුයේ,
1. මරියතුමිය ය
2. ජෝසෙප්තුමා ය
3. සෙකරියස්තුමා ය
4. එලිසබෙත් තුමිය ය

5) දස පනතින් ලැබෙන මඟ පෙන්වීම් කීපයක් පහත දැක්වේ
A අර්ථවත් හා යහපත් දිවි පෙවෙතක් ගොඩ නගා ගැනීම
B ජීවිත අපේක්ෂාවන් මුදුන් පමුණුවා ගැනීම
C දේව අභිප්‍රායයන් ඉටු කරන දේව දරුවන් වීම
D සමස්ත ලෝකවාසීන් ඉදිරියේ ගෞරවයට පත් වීම
ඒ අතුරින් නිවැරදි වනුයේ
1. A හා B ය
2. A හා C ය
3. B හා D ය
4. C හා D ය

6) ''උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක .................. යයි කියනු ලබන සේක'' ඉහත හිස්තැනට අදාළ පිළිතුර නම්,
1. ''සාමයේ කුමරයාණෝ'' යන්නයි
2. ''ප්‍රතාපවත් පියාණෝ'' යන්නයි
3. ''සදාතන පියාණෝ'' යන්නයි
4. ''පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ'' යන්නයි

7) ස්නාවක ජොහාන් තම දරුවන් ද දේව අභිමතයට අනුව දිවි ගෙවීමට සැලැස්වීම සඳහා වත්මන් දෙමාපියන්,
1. ඔවුන්ට සමාජයෙන් වෙන්වූ, හුදකලා දිවි පෙවෙතකට මං හෙළි කළ යුතුය.
2. ඔවුන්ට උසස් ආගමික අධ්‍යාපනයක් ලබා දිය යුතුය
3. දේවස්ථානයේ වත් පිළිවෙත් නිසි පරිදි පැවැත්වීම සඳහා ඔවුන් යොමු කිරීමයි
4. ඔවුන් විනයානුකූලව දේව ගරු බිය ඇතිව ඇතිදැඩි කිරීමයි

8) ගීතාවලිය 23 හඳුන්වනු ලබන්නේ

1. ''දේව යාතිකාව'' නමිනි. 2. ''එඬේර ගීතය'' නමිනි
3. ''කඳුකර යැදුම'' නමිනි. 4. ''සුරදූත ගීතය'' නමිනි

9) ජේසුස් වහන්සේගේ ගෙත්සෙමන සිදුවීමෙන් කිතුනුවාට ලබා ගත හැකි මඟපෙන්වීම නම්

1. අන්‍යයන්ට උපකාර කිරීමේ දී දුක් විඳීමට සිදුවන බවයි
2. යාච්ඤා කරන්නන්ට ජීවිත අභියෝග වලට මුහුණ පෑමට සිදු නොවන බවයි
3. ජීවිත අභියෝග වලදී යාච්ඤාවෙන් දිරිය හා සවිය ලැබෙන බවයි
4. හුදකලා වීමෙන් ජීවිත අභියෝග ජයගත හැකි බවය

10) ඉශ්‍රායෙල්වරුන් සිය නායකත්ව භූමිකාව ගොඩනංවා ගනු ලැබුවේ

1. දිවැසි රූපකය ඇසුරෙනි 2. මෙසියස් රූපකය ඇසුරෙනි
3. පූජක රූපකය ඇසුරෙනි 4. එඬේර රූපකය ඇසුරෙනි

11) මලාකි දිවැසිවරයා පැවසූ පරිදි දෙවියන්වහන්සේගේ ගිවිසුම ප්‍රකාශ කරනු ලබන්නේ

1. පූජකවරයෙකි 2. දේවදූතයෙකි 3. පරිසිවරයෙකි 4. කාන්තාවකි

12) ජේසුස් වහන්සේ අදහගත් අයට ලැබෙනුයේ

1. සියලු වරප්‍රසාද ය 2. තමා සිතනපතන දේය
3. පව් කමාවෙන් ගැලවීමටය 4. සමාජයේ උසස් තැන් ය

13) කැපකිරීමේ චාරිත්‍රය ඉටු කරන ලද්දේ,

1. සෑම ජුදෙව් පිරිමි දරුවන් සඳහාය 2. සෑම ජුදෙව් වහලුන් සඳහාය
3. සෑම ජුදෙව් දරුවන් සඳහාය 4. සෑම ජුදෙව් දරුවන් සඳහාය

14) දොළොස් වියැති ජේසුස් වහන්සේගේ ප්‍රකාශයක් වනුයේ

1. ''ඔබ මා සෙවුවේ මන්ද? යන්නයි 2. ''මාගේ පියාගේ ගෘහය කොහිද?'' යන්නයි
3. ''මාගේ මෑණියෝ කවුරහුද? යන්නයි 4. ඔබ ශෝක වන්නේ මන්ද? යන්නයි.

15) ජුදා ආගමික ජනතාව සිය පියාණන් ලෙසට හඳුන්වා ගත්තේ,

1. දාවිත්ය 2. ජාකොබ්ය 3. ඊසාක්ය 4. ආබ්‍රහම්ය

16) එදා සමාජයේ එඬේරුන්ට අහිමි වූ වරප්‍රසාදයකි

1. එක් ප්‍රදේශයක එඬේර රැකියාවේ යෙදීම
2. ගව පට්ටියක හිමිකාරීත්වය ලැබීම
3. ධර්මශාලා නමස්කාරයට එක්වීම
4. තැනින් තැනට ගමන් කිරීම

17) ජුදෙව් බලාපොරොත්තු ඉටුවන බව දිවැසිවරුන් ප්‍රකාශ කරන ලද්දේ

1. පලස්තීනය දේශපාලනීකරණය වීමෙනි
2. සාමුවෙල්ගේ මෙහෙය තුළිනි
3. ජුදෙව් ආගමික කණ්ඩායම් බලවත්වීම මඟිනි
4. ජේසුස් වහන්සේගේ උපත තුළිනි

18) චාරිත්‍ර ඉටු කිරීමේ දී කිතුනුවන් විසින් වගබලාගත යුතු කරුණකි,

1. ලාංකීය අනන්‍යතාවය රැකෙන පරිද එය ඉටු කිරීම
2. සංස්කෘතික උරුමයන් සුරකිමින් ඒවා ඉටු කිරීම
3. අන්‍යාගමිකයන් සමග සහජීවනයෙන් ඒවා ඉටු කිරීම
4. කිතුනු ඇදහිල්ලට පටහැනි නොවන පරිදි ඒවා ඉටු කිරීම

19) යෙසායා දිවැසිවරයා පැවසූ ලෙස උන්වහන්සේ රජකම ලබන්නේ

1. යුක්තියෙන් හා ධර්මිෂ්ඨකමිනි. 2. ධූරාතීතයේ සිටය
3. මහත් බලයෙන් යුක්තවය 4. සැමදෙනාගේ සහයෝගය මධ්‍යයේය

20) ''වනාන්තරයේ සමිඳුන් හට ……………….. එළි කරන්න. පාළුකරයේ අපේ දෙවිඳුන් හට …………………………… සාදන්න.
ඉහත හිස්තැන් සඳහා පිළිවෙලින් සුදුසු වචන වනුයේ,
1. ''නිවසක් හා ගෘහයක්'' යන්නයි 2. ''මාවතක් හා මහ පාරක'' යන්නයි
3. ''දිය පාරක් හා ගංගාවක්'' යන්නයි 4. ''දෙව් මැඳුරක් හා උස් ස්ථානයක්'' යන්නයි

21) දිවැසිවරුන් පැවසූ පරිදි උන්වහන්සේ ලැබූ දඬුවමින් අපට ලැබී ඇත්තේ,
1. වස්තුවයි 2. සුවයයි 3. කරුණාවයි 4. සමාදානයයි

22) ජේසුස් වහන්සේ සදා රජකම් කරනු ලබන්නේ
1. ජාකොබ්ගේ වංශය කෙරෙහිය 2. ජෙරමියාගේ වංශය කෙරෙහිය
3. සලමොන්ගේ වංශය කෙරෙහිය 4. ආමොස්ගේ වංශය කෙරෙහිය

23) ''ඔබ වනිතාවන් අතර ආශිර්වාද ලද්දීය'' යනුවෙන් පවසන ලද්දේ
1. මරියතුමිය විසිනි 2. ගාබ්‍රියෙල් දේවදූතයා විසිනි
3. එලිසබෙත් තුමිය විසිනි 4. සෙකරියස් තුමා විසිනි

24) ස්නාවක ජොහන් පාළුකරයෙහි රැඳී සිටියේ
1. තම අනුගාමිකයන් රැස්වන තුරුය
2. සේවය සඳහා දෙමාපිය කැමැත්ත ලැබෙන තුරුය
3. දේවදූතයන් ස්වර්ගයෙන් පහල වනතෙක්ය
4. තමා ඉශ්රායෙල්ට ප්‍රකාශ වන දිනය දක්වාය

25) සිමියොන් හා අන්නා බිළිඳු ජේසුස් වහන්සේ හඳුනාගත්තේ
1. ජුදා හී රජතුමා ලෙසය 2. මෙසියස් වහන්සේ ලෙසය
3. මෙහෙසුරු දිවැසිවර ලෙසය 4. ආගමික නායකයන් ලෙසය

26) මෙසිකානු ආගමනය පූර්ණත්වයට පත් වුයේ
1. දාවිත රජ පරපුරෙනි 2. ආහබ් රජ පරපුරෙනි
3. ජෙහෝවාකීම් රජ පරපුරෙනි 4. ශෙදකියා රජ පරපුරෙනි

27) පිලාත් ජේසුස් වහන්සේ පිළිබඳ අසාධාරණ විනිශ්චයක් ගෙන දෙනු ලැබුයේ
1. ජේසුස් වහන්සේට විරුද්ධව ඉදිරිපත් වු ප්‍රබල චෝදනා හේතුවෙනි
2. තම තනතුර රැකගනිමින් තමා සුරක්ෂිත වීමට මාන බැලූ හෙයිනි
3. බරබ්බස් නිදහස් කරන ලෙසට ජනතාව මහත් සේ මොර ගැසූ හෙයිනි
4. රෝම අධිරාජ්‍යයා කල ඉල්ලීම ඉටු කිරීමට තිබූ හෙයිනි

28) කිතුනු ජීවිතියේ අභ්‍යන්තරික අගයයන් කෙලෙස විය යුතු ද? යන්න පෙන්වා දීමට ජේසුස් වහන්සේ භාවිතා කල රූපකය වුයේ
1. ලුණුය 2. මුහුන්ය 3. අබය 4. තිරුඟුය

29) ලෞකිකමය හේතු නිසා දේව ආරාධනය ප්‍රතික්ෂේප කරන ජන සමූහයන්ට අනතුරු ඇඟවුයේ
1. වපුරන්නා පිළිබඳ උපමාවෙයි 2. නිධානය පිළිබඳ උපමාවෙනි
3. මුතු ඇටය පිළිබඳ උපමාවෙයි 4. මහා මංගල භෝජනය පිළිබඳ උපමාවෙයි

30) ශුද්ධ බයබලීය රාජ්‍ය සංකල්පය අනුව ඉදිරිපත් කරන ලැබූ පරිදි රජතුමා
1. බොහෝ සම්පත් වලින් සමෘද්ධ වු කෙනෙකි
2. බොහෝ ප්‍රශ්න ගැටළු වලින් පරිපූර්ණ කෙනෙකි
3. බොහෝ ප්‍රඥාවෙන් පරිපූර්ණ වු කෙනෙකි
4. බොහෝ විශ්වාසයෙන් සපිරුණු කෙනෙකි

31) සද්දුචරුන්ගේ ප්‍රධාන ආගමික පිළිවෙතක් වූයේ
1. දේවදූත නමස්කාරයේ යෙදීමය
2. වාචික සම්ප්‍රදායේ ගැලී කටයුතු කිරීමයි
3. ලිඛිත ව්‍යවස්ථාව පමණක් විශ්වාස කිරීමයි
4. පුනරුප්පීවනය පිළිබඳව නිරතුරුවම දේශනා කිරීමයි

32) ජේසුස් වහන්සේ අල්ලා ගැනීමට පැමිණි පිරිස ඉදිරියේ විද්‍යාමාන වූ උන්වහන්සේගේ ගුණාංග කාණ්ඩය වන්නේ
1. ප්‍රේමය, ප්‍රීතිය හා සමාවයි
2. කරුණාව, සාමකාමී බව හා ප්‍රීතියයි
3. ධෛර්යය, ශෝකය හා ප්‍රේමයයි
4. නිර්භීත බව, දයාව හා ධෛර්යයයි

33) දෙවියන් වහන්සේගේ පුත්‍රයෝ'' යැයි කියනු ලබන්නේ
1. හදවතින් දිළිඳු අයටය
2. අන් අය උදෙසා ශෝකවන අයටය
3. සාමය ඇතිකරන්නන්ටය
4. මොළොක් ගුණ ඇති අයට

34) යහපත් සමාරිතයාගේ උපමාව මඟින් කිතුනු ජීවිතය පිළිගන් වන්නේ
1. දේවරාජ්‍යයේ මගය
2. ස්ථානෝචිත ප්‍රඥාවේ වැදගත්කම
3. සැමවිට දිළිඳුන්ට සැලකිය යුතු බවය
4. සීමා රහිතව වැයවීමේ අවශ්‍යතාවය ය

35) ''දෙවියන් වහන්සේ සන්තක වීම සඳහා ජුදෙව්වන් ඉටුකල චාරිත්‍රය වූයේ
1. පාස්කුව පැවැත්වීමයි
2. කැපකිරීමයි
3. චර්මඡේදනයයි
4. කූඩාරම් මංගල්‍යයි

36) අප ජීවිත ගමන තුළ නොසැලී ඉදිරියට යාමට අත්‍යවශ්‍ය වනුයේ
1. දේව වචනය තුළ මුල් බැස සිටීමයි
2. නැණ නුවණ ලබා ගැනීමට
3. අන් අය සමඟ සහජීවනයෙන් කටයුතු කිරීමයි
4. හැකි පමණ සමාජ සේවා කටයුතු වල නිරත වීමයි

37) ''පල්ලියේ ගොඩනැගිල්ල ජනතාව සඳහාය'' යන උදාර සංකල්පය ඉදිරිපත් කරනු ලැබුයේ
1. ගරු පීටර් ජෙරාඩ් පියතුමා ය
2. ගරු ලක්ෂ්මන් පීරිස් පියතුමා ය
3. ගරු මයිකල් රොඩ්රිගෝ පියතුමා ය
4. ගරු චන්ද්‍රා ප්‍රනාන්දු පියතුමා ය

38) සාම්ප්‍රදායික - ගතානුගතික නියමයන්ට වහල් වීමේ නිසරු බව ජේසුස් වහන්සේ විසින් පෙන්වා දෙනු ලැබුයේ
1. උපවාස ප්‍රශ්ණයේදීය
2. අධිරාජයාට බදු ගෙවීම පිළිබඳ ප්‍රශ්නයේ දීය
3. අධිකාරී බලය පිළිබඳ ප්‍රශ්නයේ දීය
4. පුනරුත්ථාපනනය පිළිබඳ ප්‍රශ්නයේදීය

39) සේනාවක ජොහාන්තුමාගේ සමයේ කායාපස් විසින් දරනු ලැබුයේ
1. පරිසි කණ්ඩායමේ නායකත්වයයි
2. ආණ්ඩාකාර තනතුරයි
3. උත්තම පූජක තනතුරයි
4. යුවරජ තනතුරයි

40) අප දේව දරුවන් ලෙස දේව රාජ්‍යයේ පුරවැසිභාවය ලැබීමට නම්,
1. දිනපතා දේව වචනය තුළ මුල් බැස සිටිමින් නිරතුරුවම දේව කැමැත්ත ඉටුකල යුතුය
2. සමාජ සේවයේ නිරතවීම මඟින් අන් අයගේ අවශ්‍යතා සොයා බලන ඒවා ඉටුකල යුතුය
3. ආගමික චාරිත්‍ර ඉටු කරමින් කිතුනු සංස්කෘතික උරුමයන් සුරැකීමට ක්‍රියා කල යුතුය
4. සමාජ සාධාරණත්වය වෙනුවෙන් නැඟී සිටිමින් යුක්තියේ හා ධර්මිශ්ඨකමේ සමාජයක් බිහි කිරීම සඳහා ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කල යුතුය (ල 1x40=40)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

පළමු වාර ඇගයීම
முதலாம் தவணைமதிப்பீடு - 2018
**First Term Evaluation**

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: ක්‍රිස්තියානි ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

- **පළමු අනිවාර්යය ප්‍රශ්නයටත් 02 – 07 දක්වා ප්‍රශ්න අතුරෙන් කැමති ප්‍රශ්න 04කටත් පිළිතුරු සපයන්න**

<u>**අනිවාර්යය ප්‍රශ්නය**</u>

(01)

i) ජුදෙව් ජන සමාජය තුළ තෙලින් ආලේප කල භූමිකා 02ක් නම් කරන්න

ii) ඉන් අර්ථවත් වුයේ කුමක් ද?
ජේසුස් වහන්සේ පැවසු ලෙස භාග්‍යවත් කොටස් 02ක් නම් කරන්න

iii) මිනිසා හා දෙවියන් වහන්සේ අතර සබඳතාව දැක්වීම සඳහා දස පනතේ වෙන් වී ඇති ආඥාව ලියා දක්වන්න

iv) පහත හිස්තැන් පුරවන්න
…………………………………….. යනු සම්පූර්ණ සාමයයි
ජුදෙව්වෝ ……………………….. යන හෙබ්‍රෙව් වදන භාවිත කරමින් සාමය පැතුහ

v) ජේසුස් වහන්සේ ස්වභාවධර්මය අභිබවා කල හාස්කම් 02ක් ලියා දක්වන්න

vi)ජේසුස් වහන්සේ පහත සඳහන් සිදුවීම් මඟින් ඉදිරිපත් කල පාඩම/ ඉගැන්වීම නම් කරන්න
a) වැන්දඹුවගේ පිදුම -
b) ලාදුරු රෝගීන් දස දෙනා සුවපත් කිරීම -

vii) ඇදහිල්ල හේතුවෙන් දුක් විඳීමට භාජනය වු දෙදෙනෙක්  නනම් කරන්න

viii) ජේසුස් වහන්සේගේ දුක් විඳීම කරණ කොටගෙන අපට ලැබෙනුයේ කුමක් ද?

ix) ජේසුස් වහන්සේගේ නාසරෙත් ප්‍රකාශය මඟින් අවධාරණය කෙරුණු සමාජ කොටස් 02ක් නම්කොට
ඔවුන්ට උන්වහන්සේ වෙතින් ලද වරප්‍රසාදය ලියා දක්වන්න

x) ජේසුස් වහන්සේ ප්‍රේමය සම්බන්ධයෙන් ඉදිරිපත් කල ප්‍රධාන කොටස් 02 ලියා දක්වන්න

xi) ''ඉඟපටි බැඳ පහන් දල්වා තබා ගන්න'' යන කෙටි රූපකය මඟී ජේසුස් වහන්සේ ඉදිරිපත් කල ප්‍රධාන ඉගැන්වීම් දෙක ලියන්න

(2x10=20)

(02) ''ජේසුස් වහන්සේ විවිධ අවස්ථාවල ශ්‍රාවකයන් සේවය සඳහා පිටත් කර හැරිය සේක''

1 එවැනි අවස්ථා 02ක් නම් කරන්න (ල 02)

2 එම අවස්ථා දෙකෙහිම පැවරූ සමාන කාර්ය 02ක් ලියන්න (ල 03)

3 මෙහි දී ඔවුන්ට දෙන ලද උපදෙස් මඟින් වත්මන් ධර්මදූතයන්ටට ලබාගත හැකි ආදර්ශ 05ක් ලියන්න (ල 05) (ල 10)

(03) ''ආබ්‍රහම්ගේ ඇදහිල්ල නව ජන සමාජයක් බිහි කිරීමට හේතු විය''

1 ආබ්‍රහම්ගේ ඇදහිල්ල විද්‍යාමාන වූ එක් විශේෂ අවස්ථාවක් නම් කරන්න (ල 02)

2 ආබ්‍රහම් සිය ඇදහිල්ල හේතුවෙන් ලද ආශීර්වාද 03ක් ලියා දක්වන්න (ල 03)

3 ඔබ ජීවත් වන සමාජය තුළ ඇදහිල්ල වර්ධනය කිරීම සඳහා පාසල් සිසුවෙකු ලෙස ඔබට ගත හැකි ක්‍රියා මාර්ග 05ක් ලියා දක්වන්න (ල 05)

(04) ''ජේසුස් වහන්සේ ද ස්නාවක ජොහන්ගෙන් බව්තීස්මය ලැබූ සේක''

1 ජේසුස් වහන්සේගේ බව්තීස්මය අවස්ථාවේ සිදු වූ විශේෂ සිදුවීම් 02ක් නම් කරන්න (ල 02)

2 ජේසුස් වහන්සේ ස්නාවක ජොහන්ගෙන් බව්තීස්මය ලැබීමෙන් ප්‍රකාශ වූ විශේෂ කරුණු 03ක් ලියා දක්වන්න (ල 03)

3 කිතුනුවාට බව්තීස්මය වැදගත් වන්නේ මන්දැයි පහදන්න (ල 05) (ල 10)

(05) ''සදහටම පවතින ශ්‍රේෂ්ඨතම ධර්මතාව ප්‍රේමයයි''

1 තම ජීවිත වලින් ප්‍රේමය විදහා පෑ මෑත කාලීන චරිත 02ක් නම් කරන්න (ල 02)

2 පාවුලු තුමා ප්‍රේමය පිළිබඳව කොරින්ති වාසින්ට ලියූ ප්‍රේමයේ ගුණාංග 03ක් ලියන්න (ල 03)

3 දේව ප්‍රේමයේ අද්විතීය එළිදැක්ම ජේසුස් වහන්සේගේ කුරුස් පූජාවයි යන මාතෘකාව යටතේ කිතුනු පුවත් පතකට ලිපියක් ලියන්න (ල 05)

(06) ''දේව කැඳවීම විශේෂ අවස්ථාවකි''

1 මා අනුව එන්න යැයි කියමින් ජේසුස් වහන්සේ කැඳවූ …… දුන් පිළිතුර ලියා දක්වන්න (ල 02)

2 කැඳවීමේ ප්‍රතිචාර දැක්වීමේ භාරදූරකම වටහා දීම සඳහා ජේසුස් වහන්සේ ඉදිරිපත් කල නිදසුන් 02 ක් ලියා දක්වන්න (ල 03)

3 කිතුනුවා දේව කැඳවීමට කෙසේ ප්‍රතිචාර දැක්විය යුතු දැයි පැහැදිලි කරන්න (ල 05)

(07) ''මම නැති වූ බැටළුවා සොයන්නෙමි, ……………………..,

1 ඉහත පාඨය සම්පූර්ණ කරන්න (ල 02)

2 ජේසුස් වහන්සේ නමැති එඬේරාණන් ඉටු කල එඬේර කාර්යයන් 03 ක් සඳහන් කරන්න (ල 03)

3 අපි එඬේරුන් ලෙස ක්‍රියා කිරීමේ දී අප තුළ වර්ධනය කර ගත යුතු ගුණාංග ලැයිස්තුවක් පිළියෙල කරන්න (ල 05)